# කාර්යසාධන වාර්තාව

# 2023

# ධීවර අමාත්‍යාංශය


**නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත,**

**කොළඹ -10**

දුරකථන : 011-2446183 – 4 / ෆැක්ස් : 011-2541184

වෙබ් : www.fisheries.gov.lk

විද්‍යුත් ලිපිනය : secfisherieslk@gmail.com

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ආයතනයේ නම - ධීවර අමාත්‍යාංශය

## වැය ශීර්ෂ අංකය - 151

**අන්තර්ගතය** **පිටු අංකය**


| | | | |
|---|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 03 |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 06 |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 09 |
| පරිච්ඡේදය 04 | - | කාර්යසාධන දර්ශක | 16 |
| පරිච්ඡේදය 05 | - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 18 |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ | 21 |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව | 22 |
| පරිච්ඡේදය 08 | - | වෙනත් | |
| | | 8.1 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR) | 27 |
| | | 8.2 ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA) | 30 |
| | | 8.3 ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA) | 32 |
| | | 8.4 ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව(CFHC) | 33 |
| | | 8.5 ලංකා ධීවර සංස්ථාව(CFC) | 34 |
| | | 8.6 සීමාසහිත සීනෝර් පදනම(Cey-nor) | 35 |
| | | 8.7 පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය | 36 |

## 01 - ආයතනික පැතිකඩ

### 1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුද, කලපු හා අභ්‍යන්තර ජලාශ මනාලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන ධීවර කර්මාන්තයක් බිහිකිරීම උදෙසා ධීවර අමාත්‍යාංශය කටයුතු කරන අතර මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, සීමාසහිත සීනෝර් පදනම සහ පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය යන ආයතන ක්‍රියාත්මක වේ.

රජයේ ප්‍රතිපත්ති හා අදාල අණපනත්වලට මෙන්ම කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසිවලට, අනුකූලව ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා ධීවර සම්පත තිරසාර ලෙස භාවිතා කිරිම සඳහා වන ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ සැලසුම් සම්පාදනය ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානතම කාර්යභාරය වේ. මෙයට අමතරව ධීවර විෂය පථයට අනුගාමීව අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අදාල ආයතන සඳහා අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම, ඇගයීම සහ ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම ධීවර අමාත්‍යාංශය විසින් සිදුකරන ප්‍රධාන කාර්යභාර්ය වේ.

වත්මන් වෙළඳපල මිළ (2022) අනුව ධීවර අංශයේ දළ දේශීය නිෂ්පාදිතයට (GDP) 1.2% ක පමණ දායකත්වයක් සපයන අතර 2023 වසරේ සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 407,070 කි. ප්‍රමාණවත් සාගර සහ අභ්‍යන්තර ජලජ සම්පතින් හෙබි රටකට එය ඉතා කුඩා ප්‍රතිශතයකි. කෙලවල්ලන්, ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන්, මුහුදු කූඩැල්ලන් විසිතුරු මසුන් යනාදී මත්ස්‍යයින්ගෙන් සමන්විත නිෂ්පාදනයෙන් 6% ක් පමණ අපනයනය කිරිම මඟින් අපනයන කර්මාන්තයට ද සහයෝගයක් ලබාදෙමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300 කට වඩා අධික අදායමක් උපයා ගැනීමට හැකි වි ඇත. ධීවර ක්ෂේත්‍රයේ ධන වෙළඳ ශේෂයක් ද සහිතව මෙය මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදනවල ආනයන වටිනාකමට වඩා වැඩි අගයක් පෙන්නුම් කරයි.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කලමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිමය අරමුණු**

- විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
- සමුද්‍රිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම
- ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.


- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පවරා ඇති රාජකාරි

- ධීවර අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම,
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම හා විධි ප්‍රතිසංස්කරණය කිරීම,
- ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම තුලින් මත්ස්‍ය වගාවන් පුළුල් කිරීම,
- ජීව හා අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම,
- නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාල ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම,
- රජයට අයත් ධීවර යාත්‍රා කළමනාකරණය හා මෙහෙයවීම,
- පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් වන පරිදි මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කටයුතු පුළුල් කිරීම,
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබා දීම,
- ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශයේ අනවසරයෙන් මසුන් ඇල්ලීම නතර කිරීම,
- දේශීය ටින්මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම,
- ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම,
- අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය,
- ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රම හඳුන්වාදීම,
- සාගර විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- සමුද්‍ර කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය,
- බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම හා සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම හා ධීවර වරායන් සහ නැංගුරම්පොළවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය සිදු කිරීම
- ධීවර වරායවල් සහ නැංගුරම්පොළවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය
- ධීවර කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ යටිතල පහසුකම් දියුණු කිරීම හා ප්‍රමිතියෙන් යුතුව නඩත්තු කටයුතු
- මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම

## 1.4. සංවිධාන සටහන



### 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

I. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR)

### 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන /අරමුදල්

I. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA)
II. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA)
III. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව(CFHC)
IV. ලංකා ධීවර සංස්ථාව(CFC)
V. සීමාසහිත සීනෝර් පදනම)Cey-nor)
VI. පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය

### 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාල නොවේ

## 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2023 ප්‍රාග්ධන වර්ෂය සඳහා රු.මි. 3,694.89 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ අතර වසර අවසන් වන විට වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රු.මි.3,347.3 ක ප්‍රමාණයක් වැය කර ඇත.( 90.5%)

කොවිඩ් වසංගත තත්වය මත ඇතිවූ පසුකාලීන ආර්ථික අවපාත තත්ත්වය හා ඉන්ධන ඇතුළු අනෙකුත් සියළුම ධීවර උපාංගවල මිල ඉහල යාම, ධීවර කර්මාන්තයේ ඉදිරි ගමන සඳහා දැඩි බලපෑමක් එල්ල වුවද, 2023 කරදිය ධීවර කර්මාන්තයෙන් මෙ.ටො.293,945 ක මත්ස්‍ය නිෂ්පාදනයක් සපුරා ඇත. මෙ.ටො. 113,125 ක මත්ස්‍ය අස්වැන්නක් මිරිදිය ධීවර කර්මාන්තය මඟින් ලබාගැනීමට සමත් වී ඇත. ඒ අනුව 2023 වසර තුල සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 407,070 කි.

ජාතික ආර්ථිකය හා විදේශ සංචිතයන්හි වර්ධනයට මත්ස්‍ය අපනයනය තුලින් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. 2023 වසර තුල අපනයනය කරන ලද සමස්ථ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො. 24,503 කි. එහි වටිනාකම රු.මි. 99,118 කි. තවද 2023 වසර පුරා විසිතුරු මසුන් අපනයනය මඟින් රු.මි. 8,641 ක ආදායමක් ලබාගැනීමටද හැකි වී ඇත. ශ්‍රී ලාංකික ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල මට්ටමක පවත්වා ගනිමින් මන්දපෝෂණ තත්වය දුරලීම සඳහා ප්‍රධානතම ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස මත්ස්‍ය පරිභෝජනය සැලකිය හැකි වේ. එබැවින්. 2023 වසර තුල ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 32.5 ලෙස 2022 වසරට වඩා ඉහල අගයක් ලබාගැනීම, රටේ පවත්නා ආර්ථික අර්බුද තත්ත්වය හමුවේ වුවද ධීවර ක්ෂේත්‍රය ලබාගත් ක්‍රමික වර්ධනයකි. ඉදිරි වසර තුලදීද මත්ස්‍ය සම්පත කාර්යක්ෂම ලෙස පාරිභෝගික ජනතාව වෙත ලබා දීමට අපේක්ෂා කරන අතර එමඟින් උක්ත අගය තව දුරටත් වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

ධීවර ජනතාවගේ ජීවන තත්වය උසස් කරලීම, මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කිරීම මඟින්, ඉහල ගුණාත්මකතාවයකින් යුක්ත මත්ස්‍ය නිෂ්පාදනයක් අපේක්ෂා කරමින්, ධීවර ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්

සංවර්ධනය 2023 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියකි. මේ යටතේ රැකව හා මාවැල්ල නැංගුරම්පොළවල් ඉදිකර, මෙහෙයුම් කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත භාර දී ක්‍රියාත්මක තත්වයේ පවතී. ගන්දර හා මයිලඩි ධීවර වරායන්වල සංවර්ධන කටයුතුද මෙම වසර පුරා ක්‍රියාත්මක විය.

කලපු පරිසර පද්ධතිය තිරසාර ලෙස කළමනාකරණය කිරීම මඟින්, කලපු ආශ්‍රිත ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම හා කලපුවල මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම අපේක්ෂා කරමින්, කලපු සංවර්ධන වැඩසටහන 2023 වසර පුරා ක්‍රියාත්මක කෙරිණි. ආරුගම්බේ, ලංකා පටුන, නයාරු හා නන්දිකඩාල් යන කලපු ආශ්‍රිතව සංවර්ධන කටයුතු සිදුකරන ලදී. එමඟින් රටට විදේශ විනිමය උත්පාදනය කිරීම උදෙසා මෙම කලපුවල දායකත්වය ඉහල නැංවීමට හැකිවී ඇත.

එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර සඳහා සිව්වන අදියරේ වන්දි ලබාදීම 2023 වසර පුරා ක්‍රියාත්මක කෙරිනි.

මිරිදිය හා ජලජීවී වගාව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලබයි. එමඟින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම, ආහාර සුරක්ෂිතතාවය, ජනතාවගේ පෝෂණය, රැකියා සහ ජීවනෝපාය අවස්ථා සැපයීම මෙන්ම විදේශ විනිමය උත්පාදනය සඳහා වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. රටේ සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනයෙන් 25% ක පමණ දායකත්වයක් මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශය මඟින් සපයනු ලබයි. 2023 වසරේදී මත්ස්‍ය ඇඟිල්ලන් සහ මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම සඳහා ධීවර සමිති හා අනෙකුත් ආයතනවල අරමුදල් පමණක් භාවිතා කෙරිනි.

වඳවීමේ තර්ජනයට ලක්වී ඇති තඹලයා මසුන් පිළිබඳ දඹුල්ල මත්ස්‍ය ජාන ඒකකයේදී විවිධ විද්‍යාත්මක ක්‍රම පදනම් කර ගනිමින් පර්යේෂණ සිදුකර ඇත, එහි ප්‍රතිඵලයක් ලෙස වසර දෙකකට පසු ප්‍රේරිත අභිජනන ක්‍රමවේදය ( induced breeding method) මඟින් අභිජනනය සාර්ථක වීමෙන් පසු, ලෝක ජෛව විවිධත්ව දිනයට සමගාමීව 2023.05.22 දින ඉහළ මල්වතු දෝණියේ පිහිටි හබරණ කුම්බි කුලම් වැවෙහි තඹලයා මසුන් 32,000ක් තැන්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂ සංරක්ෂණය කිරීම සඳහා සංවිධානය කරන ලද පළමු වැඩසටහන ලෙස මෙය ඉතිහාස ගතවිය. මෙම ස්වාභාවික පරිසරයෙන් තුරන් වූ අවධානමට ලක් වූ මත්ස්‍යයන් ඔවුන්ගේ නිජභූමියට නැවත හඳුන්වාදීමේ වැඩසටහන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් විශ්ව විද්‍යාල සහ මේ හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු ධීවර විශේෂඥ කණ්ඩායම්වල සහාය ඇතිව සිදුකරන ලදී.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය යටතේ ආධාර ව්‍යාපෘති කිහිපයක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA) හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA) යටතේ මෙම වසරේදි ක්‍රියාත්මක විය. කෝවිඩ් වසංගතය හා පසුකාලීනව ඇතිවූ ආර්ථික අවපාතය සහ ඉන්ධන හිඟය ධීවර ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වෙත ඇතිවූ අහිතකර බලපෑමත් අවම කර ධීවර ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම හා සමාජ සුභසාධනයට මෙම විදේශ ආධාර රුකුලක් විය.

අමාත්‍යාංශය විසින් තම අරමුණු ඉටුකරගැනීමේදී දිගු කාලීන හා මධ්‍ය කාලීන ඉලක්ක වශයෙන් පහත කරුණු හඳුනාගෙන තිබුනි.

1. ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම.
   - 1.1 ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළා ගැනීමේ කර්මාන්තය සඳහා බහුදින යාත්‍රා භාවිතය ඉහළ නැංවීම.
   - 1.2 බහු දින යාත්‍රා ආශ්‍රිතව සිදුවන පසු අස්වනු හානිය 20% දක්වා අවම කිරීම.
   - 1.3 ධීවර වරායන් හා ධීවර නැංගුරම්පොළ ආශ්‍රිතව ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

2. 2027 දී කලපු ආශ්‍රිත ධීවර නිෂ්පාදනය 20% කින් ඉහළ නැංවීම.

2023 වර්ෂයේ කලපු ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය 2% කින් ඉහළ නැංවීම

3. මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.

3.1 වාණිජමය වශයෙන් ජලජීවී වගා සංවර්ධනය කිරීම.
3.2 මුහුදු කූඩැල්ලන් වගා කිරීමේ ගම්මාන ස්ථාපිත කිරීම.
3.3 මිරිදිය ධීවර කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා දැනට පවතින මත්ස්‍ය අභිජනනාගාර මධ්‍යස්ථානවල ධාරිතාවය වැඩි කිරීම.

4. ධීවර ප්‍රජාව සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.

4.1 සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා ධීවර ප්‍රජාව වෙනුවෙන් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා ධීවර රක්ෂණ ක්‍රමය ක්‍රියාවට නැංවීම.
4.2 සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා ධීවර ප්‍රජාවගේ දරුවන් වෙනුවෙන් අලුතින් ස්ථාපනය කරන ලද ඉතුරුම් යොජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

5. ධීවර ක්ෂේත්‍රයේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය වර්ධනය කිරීම

5.1 ඔලුවිල් ධීවර වරායෙහි පවතින මත්ස්‍ය සැකසුම් අංශය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ නැවත ප්‍රවර්ධනය කිරීම.
5.2 ධීවර සමූපකාර සමිතිය හරහා ධීවර වරාය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

6. පාඩු ලබන රාජ්‍ය ආයතන ලාභදායීත්වයට පත් කිරීම.

6.1 ලංකා ධීවර සංස්ථාව හා සීනෝර් පදනම යන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම.

ඉහත ඉලක්ක කරා ලඟාවීමේදී බලපාන අභියෝග වශයෙන් පහත කරුණු දැක්විය හැක.

1. ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රය නවීනතම තාක්ෂණය අත්‍යාවශයෙන්ම යොදා ගත යුතු ක්ෂේත්‍රයකි . ඒ සඳහා අධික පිරිවැයක් හා ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම
2. ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය වගා බිම් ප්‍රමාණවත් නොවීම හා වගා බිම් පවරා ගැනීමට විශාල ලෙස කාලය ගත වීම.
3. ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ධීවරයන් වෙත නවීන තාක්ෂණික ක්‍රම විධිමත්ව ලබා දීමේ වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.
4. රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකත්වය දිරිගැන්වීම

සමස්තයක් වශයෙන් ගත් කල ආර්ථික වශයෙන් රට මුහුණ දී ඇති දුෂ්කර කාලපරිච්ඡේදයක වුවද, ධීවර අමාත්‍යාංශය විසින් තම යටතේ වූ ධීවර දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන සමග සාමූහිකව ගනු ලබන සියලු ක්‍රියාමාර්ගයන් මගින් ධිවර හා ජලජ සම්පත් තිරසර භාවයෙන් යුතුව පවත්වා ගැනීමටත්, ධිවර ප්‍රජාවගේ සමාජ හා ආර්ථික මට්ටම ප්‍රශස්ථ තත්ත්වයක් කරා ළඟා කර ගැනීමටත් හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 03 - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | සත්‍ය 2023 | සත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,565,040,056 | 2,599,969,931 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 228,248,986 | 247,304,884 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,836,362 | 10,158,024 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | 3,805,125,404 | 2,857,432,839 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | 3,805,125,404 | 2,857,432,839 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | 339,567 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 3,805,125,404 | 2,857,093,272 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 180,450,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 168,538,480 | 139,715,711 | ඒසීඒ-2(ii) |
| 162,270,650 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 139,918,945 | 111,254,821 | ඒසීඒ-2(ii) |
| 3,425,400,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 3,016,050,302 | 2,542,493,049 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 1,079,350 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 330,833 | 72,000 | ඒසීඒ-2(ii) |
| 3,769,200,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | 3,324,838,560 | 2,793,535,581 | |
| | **මූලධන වියදම්** | | | | |
| 34,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 22,765,655 | 4,974,518 | ඒසීඒ-2(ii) |
| 53,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 29,480,230 | 48,326,875 | ඒසීඒ-2(ii) |
| 395,615,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 208,203,412 | 62,623,440 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 938,631 | 877,650 | ඒසීඒ-2(ii) |
| 3,258,270,000 | වෙනත් මූලධන වියදම් | 15 | 3,025,955,261 | 2,316,822,886 | ඒසීඒ-2(ii) |
| 3,741,885,000 | **මුළු මූලධන වියදම් (උ)** | | 3,287,343,189 | 2,433,625,369 | |
| | තැන්පතු ගෙවීම් | | 250,528,213 | 71,386,227 | ඒසීඒ-4 |

| | | 2023 | 2022 | |
|---|---|---|---|---|
| | අත්තිකාරම් ගෙවීම | 10,672,434 | 11,763,453 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | 261,200,647 | 83,149,680 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | 6,873,382,396 | 5,310,310,630 | |
| 7,511,085,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | (3,068,256,992) | (2,453,217,359) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | (3,068,256,992) | (2,453,217,359) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | - | - | ඒසීඒ-3 |
| | | - | - | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 994,254,549 | 721,915,845 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 22,327,722 | 23,491,650 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 1,016,582,271 | 745,407,495 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (441,895,227) | (463,010,526) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 994,254,549 | 721,915,845 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 464,222,949 | 486,502,176 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 1,016,582,271 | 745,407,495 |

පිටු අංක 7 සිට 42 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 43 සිට 49 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : කේ.එන්. කුමාරි සෝමරත්න | කේ.එන්. කුමාරි සෝමරත්න | නම : ජේ.ඒ.ඩබ්.කේ. ජයකොඩි |
| තනතුර : ලේකම් ධීවර අමාත්‍යාංශය | තනතුර : ලේකම් ධීවර අමාත්‍යාංශය | ප්‍රධාන මූල්‍ය නිලධාරි ධීවර අමාත්‍යාංශය |
| දිනය : 2024. 02 | දිනය : | දිනය : 2024/02 |
| ලේකම් කාර්යාලය, නව මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ - 10. | කොළඹ - 10. | |

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය | |
|---|---|---|
| | 2023 | 2022 |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 37,722,183 | 42,901,238 |
| අග්‍රිම ලැබීම් | 3,565,040,056 | 2,599,969,931 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 10,775,840 | 9,860,005 |
| තැන්පතු ලැබීම් | 228,248,986 | 247,304,884 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 3,841,787,065 | 2,900,036,058 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 308,253,703 | 250,907,312 |
| සහනාධාර සහ මාරුකිරීම් | 141,945,094 | 4,649,049 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 33,544,769 | 451,516,452 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 339,567 |
| අත්තිකාරම් ගෙවීම් | 10,795,386 | 8,863,594 |
| තැන්පතු ගෙවීම් | 250,528,213 | 71,386,227 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 745,067,165 | 787,662,201 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **3,096,719,900** | **2,112,373,857** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| භිමිකම් ඉවත්වීමෙ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| මූලධන වියදම් | 3,096,719,900 | 2,112,373,857 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **3,096,719,900** | **2,112,373,857** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(3,096,719,900)** | **(2,112,373,857)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |

| | | |
|---|---|---|
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ආ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)=(ආ)-(ඇ)** | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඉ) = (අ)+(ඈ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**<u>වාර්තා කිරීමේ පදනම</u>**

01. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

02. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

03. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

04. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

05. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

06. මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

### 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

**රු.000**

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තු | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තු | අවසන් ඇස්තමේන්තු | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී | - | 260 | 211 | 81% |
| 2002-02-99 | පොළිය - අනෙකුත් | 960 | 960 | 921 | 96% |
| 2003-02-99 | පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ | 20,000 | 20,000 | 30,663 | 153% |
| 2004-01-00 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් | - | - | 5,788 | 0% |
| 2006-0-2-0-2 | විවිධ | - | - | 139 | 0% |

### 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

**රු.000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 2,165000 | 3,769,200 | 3,324,839 | 88% |
| ප්‍රාග්ධන | 3,525,000 | 3,741,885 | 3,287,343 | 88% |

3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සඳහා | 535 | 535 | 535 | 100% |
| 02 | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍රය අලුත් කිරීම | 75 | 75 | 75 | 100% |
| 03 | අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ හලාවත කලපුවේ මායිම් කණු 424ක් සිටුවීමට සහ මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි කලපුව වෙත කණු 997ක් ප්‍රවාහනය සිදු කිරීම සඳහා | 751 | 751 | 596 | 79% |
| 04 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ පුත්තලම,හලාවත,නන්දිකඩාල් හා ලංකාපටුන යන කලපුවල ධීවර ප්‍රජාව හා දිස්ත්‍රික් ධීවර කාර්යාල නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 776 | 776 | 264 | 34% |
| 05 | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | මයිලෙඩ්ඩි ධිවර වරාය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍ර අලුත් කිරීම | 75 | 75 | 75 | 100% |
| 06 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | හලාවත කලපු සංරක්ෂණ හා සංවර්ධනය කිරීමේ වැඩසහනට අදාලව හලාවත කලපුව ආශ්‍රිත ඉස්සන් ගොවිපොළවල ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂාව වෙනුවෙන් වැය වන වියදම් සඳහා | 100 | 100 | 50 | 50% |
| 07 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | මිගමුව,වැල්ලවීදිය ශාන්ත සෙබස්තියන් තෙප්පන් ධීවර සංවිධානයේ කුඩා පරිමාණ ධීවරයින්හට තෙප්පම් 25ක් ලබා දීමේ ව්‍යාපෘතිය | 3,615 | 3,615 | 2,995 | 83% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | නන්දිකඩාල් හා නයාරු ව්‍යාපෘතිවලට අදාල පාරිසරික අධ්‍යන කටයුතු සම්බන්ධයෙන් සලකා බැලෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කමිටු රැස්වීමේ වැඩ කටයුතු සඳහා | 50 | 50 | 50 | 100% |
| 09 | ලේකම්,නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | හික්කඩුව ඌරාවත්තනිවාස සංකීර්ණයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී සිදු වූ මිල විචලනය ගෙවීම. | 7,800 | 7,800 | 7,800 | 100% |
| 10 | දිස්ත්‍රික් ලේකම්,කළුතර | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 72,558 | 72,558 | 62,302 | 86% |
| 11 | දිස්ත්‍රික් ලේකම්,කොළඹ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 287,603 | 287,603 | 283,668 | 99% |
| 12 | දිස්ත්‍රික් ලේකම්,ගම්පහ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම | 958,782 | 958,782 | 927,909 | 97% |
| 13 | ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2023 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය | 696,000 | 796,000 | 638,016 | 80% |
| 14 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2023 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය | 566,000 | 566,000 | 451,393 | 80% |
| 15 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2023 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය | 731,000 | 731,000 | 689,535 | 94% |

### 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 469,793 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 341,970 | | |
| 9153 | ඉඩම් | | 6,074 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 176,419 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

### 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

## 04 - කාර්ය සාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 – 90 % | 75 – 89 % | 50 – 74 % |
| කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 04ක් පැවැත්වීම | √ | | |
| ප්‍රගති වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම | √ | | |
| කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කිරීම සහ පාර්ලිමේන්තුව වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| අයවැය විවාද කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කර ඉදිරිපත් කිරීම | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ භාෂාත්‍රයෙන්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම | √ | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| අවශ්‍ය අවස්ථාවලදී අනුබද්ධිත ආයතන සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණය | √ | | |
| අමාත්‍ය මණ්ඩල සහ අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම | | √ | |

| | | | |
|---|---|---|---|
| විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්වීම (කාර්තුමය) | √ | | |
| අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන සඳහා අභ්‍යන්තර විගණනයක් පැවැත්වීම | √ | | |
| විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | | √ | |
| අදාල ආයතන සඳහා මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | √ | | |
| අයවැය ඇස්තමේන්තු සකස්කිරීම | √ | | |
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම | √ | | |
| භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සහ වාර්තා කිරීම | | √ | |
| සැපයුම් කළමනාකරණය | | √ | |
| මූල්‍ය පුරෝකථන සකස් කිරීම | √ | | |
| ගෙවීම්(වැටුප් සහ වේතන, අතිකාල, ණය) | √ | | |
| පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | √ | | |
| අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි නීතිමය කටයුතු | √ | | |
| වාහන නඩත්තු | √ | | |
| ආයතනයන්හි පරිපාලන කටයුතු | √ | | |
| පුහුණු සහ ශිෂ්‍යත්ව | √ | | |
| සේවක සුබසාධනය | | √ | |
| මානව හිමිකම් කමිටුව, මහජන පෙත්සම් කාරක සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (COPE) සඳහා සහභාගී වීම | √ | | |

**4.2. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | **90% - 100%** | **75% - 89%** | **50% - 74%** | |
| 2023 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 305,840 දක්වා වැඩි කිරීම | √ | | | $\frac{293,945}{305,840}$ X 100 = 96.11% |
| 2023 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 131,620 දක්වා වැඩිකිරීම | | √ | | $\frac{113,125}{131,620}$ X 100 = 85.94% |
| එක් දිනක් තුළ ග්‍රෑම් 43.28 දක්වා ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම | | √ | | $\frac{32.5}{43.28}$ X 100 – 75.08 % |

## 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .

| ඉලක්ක / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%-74% | 75%-100% | |
| තිරසාර සංවර්ධන ඉලක්කය 14 (තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය.) | 2023 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 305,840 කි | මෙ.ටො 293,945 | | | √ | $\frac{293,945}{305,840}$ X 100 = 96.11% |
| | 2023 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 131,620 කි | මෙ.ටො. 113,125 | | | √ | $\frac{113,125}{131,620}$ X 100 = 85.94% |
| | 2023 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 43.28 දක්වා වැඩි කිරීම. | දිනකට ග්‍රෑම් 32.5 | | | √ | $\frac{32.5}{43.28}$ X 100 = 75.08% |
| තිරසර සංවර්ධන ඉලක්ක 12 (තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම.) | මත්ස්‍ය අපනයන වැඩිකිරීම 2023 වසරේදී මෙ.ටො. 24,550 දක්වා වැඩි කිරීම | මෙ.ටො. 24,503 | | | √ | $\frac{24,503}{24,550}$ X 100 = 99.8% |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

14.7.1, ඉලක්කය, 2030 වන විට ධීවර, ජලජීවී වගාව සහ සංචාරක කර්මාන්තයේ තිරසාර කළමනාකරණය තුළින් සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ වැඩි කර ගැනීම.
දර්ශකය 14.7.1 : කුඩා රාජ්‍යයන්, අඩු සංවර්ධිත රටවල් සහ සියලුම රටවල දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ධීවර කටයුතු (ප්‍රොක්සි දර්ශකය)

| දර්ශකය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අගය එකතු කරන ලද කරදිය මත්ස්‍ය ධීවර කර්මාන්තය (%) | - | - | - | - | - | 0.90 | 0.90 | 1.0 | 1.0 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අගය එකතු කරන ලද මිරිදිය ධීවර හා ජලජීවී වගාව (%) | - | - | - | - | - | 0.21 | 0.20 | 0.2 | 0.2 |
| ධීවර හා ජලජීවී වගාවෙහි දළ දේශීය නිෂ්පාදිතය ( GDP) | 1.4 | 1.4 | 1.3 | 1.4 | 1.3 | 1.1 | 1.1 | 1.2 | 1.2 |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය – 2020-2021 / තිරසර සංවර්ධන සභාව

**ඉලක්ක 14.b, කුඩා පරිමාණ ශිල්පීය ධීවරයින් සඳහා සමුද්‍ර සම්පත් සහ වෙළඳපල වෙත ප්‍රවේශය ලබා දීම.**

ඉලක්ක 14.b.1 ,නීතිමය/නියාමන/ ප්‍රතිපත්තිමය /ආයතනික රාමු ප්‍රස්ථාරයක යෙදවුම් ප්‍රමාණය හඳුනා ගැනීම සහ කුඩා පරිමාණ ධීවර කර්මාන්තය සඳහා ප්‍රවේශ අයිතීන් ආරක්ෂා කිරීම.

| | 2020 | 2022 | ඉලක්ක ගත 2030 |
|---|---|---|---|
| 1. විශේෂයෙන් කුඩා පරිමාණ ධීවර ක්ෂේත්‍ර ඉලක්ක කරගත් හෝ ඊට අදාළව නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සැලසුම් හෝ උපාය මාර්ග පැවතීම. | 40% | 40% | 100% |
| 1. SSF මාර්ගෝපදේශය ක්‍රියාවට නැංවීම සඳහා දැනට ක්‍රියාත්මක විශේෂිත මුලපිරීම් | 30% | 30% | 100% |
| කුඩා පරිමාණ ධීවරයින් සහ මත්ස්‍ය කම්කරුවන් කුඩා පරිමාණ ධීවර කර්මාන්තය සඳහා කළමනාකරණ සැලසුම් සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට දායක වන යාන්ත්‍රණයක් පැවතීම. | 30% | 30% | 100% |


මූලාශ්‍රය: ධීවර දෙපාර්තමේන්තුව / තිරසර සංවර්ධන සභාව

ඉලක්ක 14.6, 2022 වන විට අධි ධාරිතාවට සහ අධික ලෙස මසුන් ඇල්ලීමට දායක වන ඇතැම් ආකාරයේ ධීවර සහනාධාර තහනම් කිරීම, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට දායක වන සහනාධාර ඉවත් කිරීම සහ එවැනි නව සහනාධාර හඳුන්වා දීමෙන් වැළකීම, ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡාවල ඌන සංවර්ධිත රටවල් සංවර්ධනය සඳහා සුදුසු සහ ඵලදායී විශේෂ සහ අවකලනා ක්‍රමවේද පිළිබඳව සාකච්ඡාව අනිවාර්ය අංගයක් විය යුතු බව හඳුනා ගැනීම.

14.6.1 දර්ශක, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර උපකරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය (දර්ශකය)

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය පිළිබඳ ඉන්දියානු සාගර ටූනා කොමිසම විසින් අදාළ නීති සහ ගිවිසුම්වලට අනුකූල වීමේ අනුපාතය

| වසර | අනුකූලතා අනුපාතය |
|---|---|
| 2010 | 5% |
| 2011 | 18% |
| 2012 | 47% |
| 2013 | 51% |
| 2014 | 60% |
| 2015 | 74% |
| 2016 | 77% |
| 2017 | 82% |
| 2018 | 87% |
| 2019 | 90% |
| 2020 | 86% |
| 2021 | 76% |
| 2022 | 83% |




මූලාශ්‍රය: ධීවර දෙපාර්තමේන්තුව / තිරසර සංවර්ධන සභාව

### 5.2.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ඇති අභියෝග

1. මෙම කාල පරාසය තුලදී ඇතිවූ ඉන්ධන හිඟ තත්වය, ඉන්ධන මිල ඉහළ යාම,ශ්‍රම වියදම ඉහළ යාම හා අයිස් වැනි යෙදවුම් ද්‍රව්‍ය වල මිල ඉහළ යාම, ධීවර දැල් ආදී ධීවර ආම්පන්න මිල ඉහළ යාම හේතුවෙන් ධීවරයින් මත්ස්‍ය කර්මාන්තයට දක්වන රුචිකත්වය අඩුවීම.
2. මත්ස්‍ය නිෂ්පාදන වල මිල ගණන් පසුගිය වසරේ මෙම කාලයට සාපේක්ෂව දෙගුණයකින් පමණ ඉහළ ගොස් ඇති බැවින් මත්ස්‍ය පරිභෝජනය සාපේක්ෂව අඩු වීම.
3. වෙරළබඩ සම්පත් බොහොමයක් විද්‍යාත්මක සාක්ෂි නොමැතිව දුර්වල ලෙස කළමනාකරණය කර ඇත.ඇතැම් අවස්ථා වල සම්පත් භාවිතා කරන්නන් දුර්වල ලෙස අධීක්ෂණය කිරීම තුළින් සම්පත් අධික ලෙස සූරාකෑම සහ විනාශ වීම සිදු වේ.එබැවින් කළමනාකරණය කරන්නන්ගේ සහ පරිශීලනය කරන්නන්ගේ සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ආකල්ප වර්ධනය කළ යුතුය. මීට අමතරව පවත්නා නීතිය බලාත්මක කිරීමට බලාත්මක කිරීමේ නිලධාරීන්ට නිසි දැනුම හෝ පහසුකම් ලබා දීම අවශ්‍යව ඇත.
4. ධීවර හා සාගර අංශ සම්බන්ධ නවීන පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීමට තාක්ෂණික හා මූල්‍යමය බාධා හේතු වී ඇත. සාමාන්‍ය ජනතාව අතර සමුද්‍ර පරිසර පද්ධති වල වටිනාකම පිළිබඳ දුර්වල දැනුවත්භාවය ඒවා විනාශ වීමට හේතු වේ. විවිධ ආයතන අතර කාර්යභාරයන් එකිනෙක අතපසු වී පැවතීම තුළ අවසානයේ කිසිවෙකු වගකීම භාර නොගනී. ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැතිවීම බරපතල කාරණයකි.
5. නීති විරෝධී හා හානිදායක පරිදි මසුන් ඇල්ලීමේ අවදානමක් පැවතීම.
6. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දුර්වලතා.
7. කලමනාකරණය සහ මත්ස්‍ය වෙළඳාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.
8. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසාර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව
9. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම.

## 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජොෂ්ඨ | 30 | 21 | පුරප්පාඩු 09<br>අතිරික්ත 01 |
| තෘතීයික | 04 | 04 | - |
| ද්විතියික | 169 | 137 | 32 |
| ප්‍රාථමික | 40 | 39 | පුරප්පාඩු 02<br>අතිරික්ත 01 |
| වෙනත් | 3 | - | 03 |

### 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ. සේවාව තවරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

### 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (Rs. '000) | | වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 44 | දින 01 | 13,400/- | - | දේශීය | පුහුණු විෂය ක්ෂේත්‍රව ල සමස්ත ඵලදායි තාවඉහළ නංවා ඇත. |
| රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිය | 37 | දින 01 | 13,700/- | - | දේශීය | |
| අභිප්‍රේරණය | 46 | දින 01 | 18,640/- | - | දේශීය | |
| රියදුරු මාරගෝපදේශ / රථවාහන නීති සහා සෞඛ්‍යය අධ්‍යාපනය | 15 | දින 01 | 15,000/- | - | දේශීය | |
| ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහළ නැංවීම | 18 | දින 01 | 80,000/- | - | දේශීය | |
| සන්නිවේදන කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන | 54 | පැය 07 | 15,000/- | - | දේශීය | |
| කාර්යාල කළමනාකරණය සහ ආචාර ධර්ම පිළිබඳ පුහුණු කිරීමේ පාඨමාලාව | 40 | දින 01 | 80,000/- | - | දේශීය | |
| ඵලදායිතා පුහුණු වැඩසටහන | 16 | දින 01 | 21,000/- | - | දේශීය | |
| ගීත රසාස්වාද - | 150 | දින 01 | 105,949/ | - | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මත්ස්‍ය ගහන සනත්වය වැඩිකිරීමේ පුහුණු වැඩසටහන | 25 | දින 07 | 575,942 | - | දේශීය | |

## 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| **02** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,3 | විගණන විමසුම් ලේඛණය යාවත් කාලින කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලින කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු.රෙ 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | ඇතැම් විගණන විමසුම් වලට අමාත්‍යාංශයේ විවිධ අංශ මගින් තොරතුරු කැඳවා ඇත | පිළිතුරු ලබාගත් පසු කඩිනමින් පිළිතුරු ලබාදීමට නියමිතය |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසමඟ සාකච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | කමිටු 04 ට අදාල කරුණු සාකච්ඡා කර ඇත. | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | . | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ | පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීමට නොහැකි විය | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාල නැත | කල්බදු කාල සීමාවෙන් අනතුරුව අයිතිය | |

| | | | | |
|---|---|---|---|---|
| | | | පැවරෙන පරිදි වාහන ලබාගෙන නොමැත | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | මේ වන විට එවැනි ණය ශේෂ වලින් කොටසක් ලේකම්තුමියගේ අනුමැතියට යටත්ව නිරවුල් කර ඇති අතර, එවැනි ණය ශේෂ කිහිපයක් නිරවුල් කිරීමට අනුමැතිය ලබාගැනිම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම | අදාල නැත | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අදාල නැත | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නැත | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | 2024 වර්ෂය සඳහා සකස් කර ඇත. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | | 2023.11.30 දිනැති රා.ප.ච.02/2018(1) හි 3 ඡේදයෙහි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දක්වා ඇත. |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

## 08 ධීවර අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන

### <u>8.1 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR)</u>

**දැක්ම**

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ත දායකත්වයක් ලබාදීම

**මෙහෙවර**

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම

**අරමුණු**

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසර සංවර්ධනය.
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- පසුඅස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරිම.
- අන්තර් ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම.
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම.
- මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ග ගත ක්‍රමයට ධීවර ප්‍රජාවට හා අනෙකුත් සේවාදායකයින්හට ප්‍රශස්ත සේවාවක් ලබාදීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම.
- ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම

**ප්‍රධාන කාර්යයන්**

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම.
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යෙදවුම් සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමූපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම

- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයනය සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවිකිරීම හා අධීක්ෂණය
- ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම හා නියාමනය
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවලදී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවෙමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය හා විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මඟින් ධීවර සමාජ ආරක්ෂණය
- කළපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර ගම්මානවල යටිතලපහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති**

- ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර යටතේ ශ්‍රී ලංකාවේ කොළඹ, කළුතර, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්කවල වඩාත් අවදානමට ලක්විය හැකි මෝටර් රහිත සම්ප්‍රදායික බෝට්ටු හිමි අඩු පහසුකම් සහිත ධීවරයින් 5058 ක් සඳහා මුදල් ලබාදෙන ලදී.
- ජපන් රජයේ ආධාර යටතේ උතුරු හා නැගෙනහිර පළාත්වල ධීවර කර්මාන්තය සඳහා අදියර 2ක් යටතේ උපකරණ ලබා දීමට අනුමැතිය ලැබී ඇත.

- පළමු අදියර යටතේ ධීවර කටයුතු ප්‍රවර්ධනය සහ ශීත කටයුතු වලට අදාළ ව පහත උපකරණ ලබාදීම සිදුකරනු ලබයි. Ice Making Machine, Digital Platform Scale, Fishing Net, Refrigerator, Cargo Truck, Prefabricated Refrigerator/ Freezer
- දෙවන අදියර යටතේ ධීවරයින්ගේ ආරක්ෂාවට අදාළව පහත උපකරණ ලබාදීම සිදුකෙරේ. Patrol Boat, Rigid Hull Inflatable Boat (RIB), Lighted Buoy, HF Radio Transceiver

**යෝජිත නව ව්‍යාපෘති**

- බස්නාහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා මත්ස්‍ය එකතු කිරීමේ උපකරණ (FAD - Fish Aggregating Devices ) පිහිටුවීම.
- නව ධීවර පනත සහ රෙගුලාසි කෙටුම්පත සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
- මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයන ඉපැයීම් වැඩි කිරීමට (ඇ.ඩො.මි. 300 සිට ඇ.ඩො.මි. 315 දක්වා) පහත පරිදි පහසුකම් සැලසීම -
    - බලපත්‍ර නිකුත් කිරීම
    - සෞඛ්‍ය ආරක්ෂිත භාවය පිළිබඳ තත්ත්ව සහතික නිකුත් කිරීම
    - IU සහතික නිකුත් කිරීම
    - on board online system සංවර්ධනය කිරීම

**2023 වසරේ මූල්‍ය කාර්ය සාධනය (ප්‍රාග්ධන)**

වෙන් වූ මුදල රු.මි. 81.00 වූ අතර, වියදම් කරන ලද මුදල රු.මි. 60.00 කි. මූල්‍ය ප්‍රගතිය 74% කි.

## 8.2 ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA)

**දැක්ම**

කලාපයේ ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රමුඛතම ආයතනය වීම.

**මෙහෙවර**

විද්‍යාත්මක හා තාක්‍ෂණික දැනුම සහ සම්පත් පදනම උපයෝගී කරගනිමින් ජලජ සම්පත් අංශයේ ජාතික සංවර්ධන ගැටලු සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

**කාර්යභාරය**

- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) යනු ජලජ සම්පත් ආශ්‍රිත පර්යේෂණ, සංවර්ධන සහ කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන ජාතික ආයතනයයි.
- ජීවී හා අජීවී ජලජ සම්පත් සම්බන්ධ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා විද්‍යාත්මක හා තාක්‍ෂණික විශේෂඥතාව යොදා ගැනීම සහතික කිරීම.
- පහත සඳහන් ක්ෂේත්‍රවල ජලජ සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා යොමු වූ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ ප්‍රවර්ධනය කිරීම;
  - සාගර විද්‍යාව සහ ජල විද්‍යාව.
  - ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න සහ උපකරණ සහ ධීවර ක්‍රම වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.
  - ධීවරයින්ගේ සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සුභසාධනය ඇතුළුව ධීවර කර්මාන්තයේ සමාජ හා ආර්ථික අංශ.
  - මත්ස්‍ය හා ජලජ නිෂ්පාදන සැකසීම, සංරක්ෂණය සහ අලෙවි කිරීම.
  - අභ්‍යන්තර ජලාශ, වෙරළබඩ තෙත් බිම් සහ වෙරළාසන්න ප්‍රදේශවල ජලජ සම්පත් සංවර්ධනය, කළමනාකරණය සහ සංරක්ෂණය.
  - ජලජ සම්පත් සූරාකෑම, කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සම්බන්ධ විද්‍යාත්මක, තාක්‍ෂණික සහ නීතිමය කාරණා සම්බන්ධයෙන් උපදේශන සහ උපදේශන සේවා සැපයීම.
- ජලජ සම්පත් සූරාකෑම වැලැක්වීම, සැලසුම් කිරීම, පර්යේෂණ, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය සහ කළමනාකරණය සම්බන්ධව ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සහ ධීවර කර්මාන්තය සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු සහ දත්ත රැස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රකාශනය කිරීම භාර ගැනීම.
- නියෝජිතායතනයේ කටයුතු කරගෙන යාමට හෝ සහාය වීමට අවශ්‍ය පුද්ගලයින් සඳහා පුහුණුව ලබා දීම..

**2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති**

- **බහුදින ධීවර යාත්‍රා සඳහා නවීකරනය කළ සිසිලන පද්ධතියක් හඳුන්වා දීම.**
  බහුදින ධීවර ක්ෂේත්‍රයේ පසුඅස්වනු හානි ප්‍රතිශතය අවම කිරීමේ අරමුණින් නාරා ආයතනය මගින් මෙම ව්‍යාපෘතිය දියත් කෙරුණේ ධිවර අමාත්‍යාංශය, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) හි මූල්‍යමය දායකත්වය යටතේයි. ව්‍යාපෘතිය යටතේ, තෝරා ගත් බහුදින ධීවර යාත්‍රාවක් මත්ස්‍ය ගබඩාවේ අයිස් දියවීමේ ශීඝ්‍රතාවය අවම වන පරිදි සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරිමෙන් හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරිම මගින් නවීකරණයට භාජනය කෙරිණි. නවීකරණය කරන ලද බහුදින යාත්‍රාව සාර්ථක අත්හදා බැලීම් දෙකක් සිදු කර ඇත

- **කරවල සහ උම්බලකඩ කර්මාන්තය වැඩිදියුණු කිරීම**
  දකුණු පළාතේ කරවල සහ උම්බලකඩ කර්මාන්තය නගාසිටුවීම සඳහා පසුඅස්වනු තාක්ෂණික අංශය ක්‍රියා මාර්ග ගෙන ඇත. මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකබව හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය වැඩි දියුණු කිරීමේ සහ ඒවායේ වෙළඳපොළ වටිනාකම ඉහළ දැමීමේ අරමුණින් මෙම ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), සී-නෝර් පදනම (CEYNOR) සහ පෞද්ගලික අංශය සමග එක්ව, පසු අස්වනු තාක්ෂණික අංශය විසින් සම්ප්‍රදායික රසට හානි නොවන සේ සෞඛ්‍යාරක්ෂිතව උම්බලකඩ නිෂ්පාදනය කිරීම සඳහා නව්‍ය උපකරණ කට්ටලයක් හඳුන්වා දී ඇති අතර, උසස් තත්ත්වයේ නිෂ්පාදන සිදු කළ හැකි පරිදි එම උපකරණ ප්‍රතිලාභීන් හය දෙනෙකු අතර බෙදා හැර ඇත.

- **දකුණු වෙරළ තීරය සඳහා වෙරළ ජල තත්ත්ව දර්ශකය (WQI) සංවර්ධනය කිරීම**
  උණවටුන, මිරිස්ස සහ පොල්හේන යන වෙරළ තීරයන්ගේ වත්මන් ජල තත්ත්වය, ජල තත්ත්ව දර්ශකයක් දියුණු කිරීම මඟින් නිර්ණය කිරීම මෙහිදි සිදුකරනු ලැබේ. එසේ ලබාගන්නා දත්ත මගින් එකී වෙරළ තීරයන්ට නීල ධජ සහතිකය ලබාගැනීමේ ශක්‍යතාවය ද අධ්‍යනයය කරනු ලැබේ. සංචාරක කර්මාන්තයෙහි උන්නතිය වෙනුවෙන් මෙම වෙරළ තීරයන් දියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණක් ලෙස දැක්විය හැකිය.

- **හලාවත කළපුවෙහි තිරසර සංවර්ධන සැලස්ම සඳහා නිරීක්ෂණ**
  හලාවත කළපුවෙහි ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිඵලවලට අනුව, ජල ද්‍රාව්‍ය ඔක්සිජන් ප්‍රමාණය සහ ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම යන පරාමිතීන්හි මධ්‍යන අගයන්, 2019 අංක 01 දරන ජාතික පාරිසරික රෙගුලාසි හි සම්මත ජල තත්ත්ව ප්‍රමිති අගයන් ඉක්මවා යාමට ඉතා ආසන්න විය. එමෙන්ම ජලයේ රසායනික ඔක්සිජන් ඉල්ලුම සහ තෙල්/ ග්‍රීස් සාන්ද්‍රණය ඉහත ප්‍රමිතින්හි උපරිම අගයන් ඉක්මවා ඇත. කළපුවේ දකුණු ඉවුර ආසන්නයේ සහ යාබද ඉස්සන් කොටු ඇති ස්ථාන කිහිපයක ඇල්ගී උඩුමණ්ඩි තත්ත්වයන් දැකිය හැකි විය. එම ඇල්ගී නියැදි පරීක්ෂා කිරීමේදී Oscillatoria වර්ගය ප්‍රමුඛ බව අනාවරණය විය.

**යෝජිත නව ව්‍යාපෘති**

- තෝරාගත් කලපු 03 ක ඉස්සන් පසු කීටයන් මිලියන 9ක් තැන්පත් කිරීම.
- නන්දිකඩාල් කලපුවේ ඝන මීටර් 30000 ක සුන්බුන් පිරිසිදු කිරීම

**2023 වසරේ මූල්‍ය කාර්ය සාධනය(ප්‍රාග්ධන)**

පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් වෙන් වූ මුදල රු.මි.35.00 කි. එහි මූල්‍ය ප්‍රගතිය 100% කි. අතිකුත් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්වූ මුදල රු.මි. 90.00 කි. ඉන් රු.මි. 23.78 ක් වියදම් කර ඇති අතර මූල්‍ය ප්‍රගතිය 26% කි.

## 8.3 ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA)

**දැක්ම**

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසර සංවර්ධනය සහ කළමනාකාරිත්වය තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම

**මෙහෙවර**

කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යවසායන් සංවර්ධනය දිරිමත් කිරීම හා චිරස්ථායී ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුළින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමත් ග්‍රාමීය සමාජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.

**කාර්යභාරය**

- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් සංවර්ධනය තුළින් මත්ස්‍ය නිෂ්පාදනය සහ මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම.
- මිරිදිය සහ කිවුල්දිය ජලජීවී වගාව සංවර්ධන කිරීම තුළින් ධීවර ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සුලභ කිරීම.
- අපනයනය සඳහා වැඩි වටිනාකමක් ඇති ආහාරමය මත්ස්‍ය වගාව, විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි වගාව දියුණු කිරීම.
- පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජලජීවී සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.
- කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණයේ ජලජීවී ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.
- ජෛව විවිධත්ව ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව, ජලජ සම්පත් හා වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ජලජ සම්පත් ආනයනය, අපනයනය, විකිණීම සහ බෙදාහැරීම පිළිබඳ ව්‍යාපාරිකයෙකු, පහසුකම් සපයන්නෙකු සහ බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම සහ ඒ කටයුතු වලට සහාය වීම.
- ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති**

- **තඹලයා *(Labeo lankae)* අභිජනනය හා නැවත හඳුන්වාදීමේ වැඩසටහන**
  වඳවීමේ තර්ජනයට ලක්වී ඇති තඹලයා මසුන් පිළිබඳ දඹුල්ල මත්ස්‍ය ජාන ඒකකයේදී විවිධ විද්‍යාත්මක ක්‍රම පදනම් කර ගනිමින් පර්යේෂණ සිදුකර ඇත, එහි ප්‍රතිඵලයක් ලෙස වසර

දෙකකට පසු ප්‍රේරිත අභිජනන ක්‍රමවේදය ( induced breeding method) මඟින් අභිජනනය සාර්ථක වීමෙන් පසු, ලෝක ජෛව විවිධත්ව දිනයට සමගාමීව 2023.05.22 දින ඉහළ මල්වතු ද්‍රෝණියේ පිහිටි හබරණ කුම්බි කුලම් වැවෙහි තඹලයා මසුන් 32,000ක් තැන්පත් කරන ලදී.

- **වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය**

  මුහුදු කූඩැල්ලන් අපනයනය ඉහළ නැංවීම සඳහා මුහුදු කූඩැල්ලන් ගම්මානය කිලිනොච්චියේ වලෙයිපාඩු ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. එමෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ මුහුදු කූඩැල්ලන් වගාව සඳහා අක්කර 1900 ක් හඳුනාගෙන ඇත.

- **මොදා මත්ස්‍ය වගාව සහ මුහුදු පැළෑටි වගාව**

  මොදා මත්ස්‍ය වගාව මඟින් 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් **942** ක අස්වැන්නක් ලබා ගෙන ඇති අතර මුහුදු පැළෑටි වගාව මඟින් 2023 වසරේ සැප්තැම්බර් මස වන විට මෙ.ටොන් **1239** (තෙත් බර) අස්වැන්නක් ලබා ගෙන ඇත.

- **විසිතුරු මත්ස්‍ය වගාව**

  රම්බඩගල්ල, ගිනිගත්හේන සහ සෙවණපිටිය යන මධ්‍යස්ථාන මඟින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට විසිතුරු මසුන් මිලියන 2.70ක් ගොවීන්ට හා අපනයනකරුවන්ට අලෙවිකර ඇත. තව ද රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යස්ථානය මඟින් පුද්ගලයන් 595 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී.

**යෝජිත නව ව්‍යාපෘති**

- මත්ස්‍ය ඇඟිල්ලන්, මත්ස්‍ය ඇසිත්තන්, මිරිදිය ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීම -

  මේ යටතේ ප්‍රධාන වැව් - 30, මධ්‍යම වැව් - 60 සහ කුඩා වැව් - 40 මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 30ක් තැන්පත් කිරීමට යෝජිතය. කූඩු 175 ක් තුළ මත්ස්‍ය ඇසිත්තන් මිලියන 19ක් තැන්පත් කිරීමට අපේක්ෂා කෙරේ. මිරිදිය ඉස්සන් පසු කීටයන් මිලියන 24ක් තැන්පත් කිරීමට යෝජිතය.

**2023 වසරේ මූල්‍ය කාර්ය සාධනය (ප්‍රාග්ධන)**

වෙන් වූ මුදල රු.මි. 200.00 වූ අතර, වියදම් කරන ලද මුදල රු.මි. 108.95 කි. මූල්‍ය ප්‍රගතිය 55% කි.

## 8.4 ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව(CFHC)

**දැක්ම**

දේශීය ධීවර ප්‍රජාවගේ අභිලාෂයන් ඉටුකිරීම සඳහා ධීවර කර්මාන්තයේ මූලික සම්පත් දායකයා බවට පත්වන අතරම කලාපීය සමුද්‍ර ව්‍යවසායේ ප්‍රමුඛතම පහසුකම් සපයන්නා බවට පත්වීම.

**මෙහෙවර**

ධීවර ප්‍රජාවට සියලු නවීන පහසුකම් සැපයීම සඳහා යටිතල පහසුකම් සඳහා සහය වීමත් සමඟ උසස් තත්ත්වයේ ධීවර වරාය ආශ්‍රිත සේවාවන් සැපයීම සහ වාණිජමය වශයෙන් ශක්‍ය ව්‍යාපාර හරහා වරායන් වැඩිදියුණු කිරීම තුළින් ස්වයං තිරසාරභාවය ළඟා කර ගැනීම.

**කාර්යභාරය**

- ධීවර වරායන්, නැංගුරම්පොළවල්, සමුද්‍ර ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් සැලසුම් කිරීම, සැකැස්ම සහ ඉදිකිරීම්,
- ධීවර වරායන්, නැංගුරම් පොළවල්, සමුද්‍ර ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම, පාලනය සහ නඩත්තු කිරීම.
- ධීවර වරායන්, නැංගුරම් පොළවල් සහ අනෙකුත් වෙරළ පහසුකම් කළමනාකරණය කිරීම.
- ධීවර යාත්‍රා සඳහා අලුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම.
- ශීත කාමර, අයිස් නිෂ්පාදනාගාර සහ අනෙකුත් ශීතකරණ පහසුකම් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- ධීවර කර්මාන්තයේ සහ ධීවරයින්ගේ කාර්යයන් සඳහා ජලය, ඉන්ධන, ලිහිසි තෙල්, විදුලිය, අයිස්, ශීත කාමර පහසුකම් සහ වෙනත් ඕනෑම සේවා සහ ඊට අනුබද්ධ වෙනත් සේවාවන් සැපයීම.
- ධීවර අමාත්‍යාංශය තුළ ඇති ධීවර වරායන්, නැංගුරම් පොළවල්, සමුද්‍ර ව්‍යුහයන් සහ අනෙකුත් සංවිධානවලට ආරක්ෂාව සැපයීම.
- ජලජ සම්පත්, සහ ඒ සඳහා අය කිරීම්, ගාස්තු සහ වෙනත් ගෙවීම් අයකර ගැනීම.
- ශ්‍රී ලංකාවේ සුවිශේෂී ආර්ථික කලාපයේ (EEZ) අධීක්ෂණය, පාලනය, නිරීක්ෂණය.

**2023 වසරේ මූල්‍ය කාර්ය සාධනය (ප්‍රාග්ධන)**

වෙන් වූ මුදල රු.මි. 50.00 වු අතර, වියදම් කරන ලද මුදල රු.මි. 45.99 කි. මූල්‍ය ප්‍රගතිය 92% කි.

## 8.5 ලංකා ධීවර සංස්ථාව (CFC)

**දැක්ම**

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභ සිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වානිජමය ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

- එලදායි සංවිධානයක් යටතේ දළ ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබා දීම.
- මසුන් නිෂ්පාදනය හා සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම.
- ධීවර ජනතාවගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගාසිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.
- නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්ත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරත වීම

**වත්මන් තත්ත්වය**

- ලංකා ධීවර සංස්ථාව තුළ මාළු මිලදී ගැනීම සහ විකිණීමට අදාළව දිස්ත්‍රික් කාර්යාල ඇතුලු අංශ 21ක් පවතින අතර එහි ප්‍රධාන කාර්යාලයේ ගැනුම් හා විකුණුම් කාර්යාල 08ක් සහ මිලදී ගැනීමේ කාර්යාල 13 ක් ඇත. ලංකා ධීවර සංස්ථාවට දිවයින පුරා අලෙවිසැල් 98ක් ඇත.

- වර්තමානයේදී, ලංකා ධීවර සංස්ථාවේ සමස්ත මෙහෙයුම් ක්‍රියාවලිය (2023 ජනවාරි සිට අගෝස්තු දක්වා) රු. මිලියන 59.9 ක පාඩුවක් වාර්තා කරයි.

- මෙම අගෝස්තු මාසය වන විට ගම්පහ, මෙට්‍රෝ, මහනුවර, ත්‍රිකුණාමලය, මාතර, අනුරාධපුර, කෑගල්ල, රත්නපුර, අම්පාර, අනුරාධපුර අයිස් කම්හල සහ මින්නේරිය, අම්බලන්ගොඩ යන ස්ථානවල අලෙවි විධායක නිලධාරීහු ලාභදායීව පවත්වාගෙන යති. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල සහ අංශ 08 ලාභ නොලබයි.

**යෝජිත නව ව්‍යාපෘති**

මේ යටතේ පහත සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙයි.

1. නව අලෙවිසැල් 25ක් ආරම්භ කිරිම.
2. මාළු සඳහා ගෙවීම් කිරීමේදී QR කේතය හරහා ගෙවීමේ ක්‍රමයක් හඳුන්වාදීම - පළමු පියවර ලෙස දිස්ත්‍රික්ක දෙකක (කොළඹ සහ බේරුවල) දැනටමත් මෙය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.
3. මාළු කන්ටේනර් 04ක් එනම් මෙට්‍රික් ටොන් 108ක් සෘජුවම විදේශීය සැපයුම්කරුවන්ගෙන් ආනයනය කර විකිණීමට සැලසුම් කර ඇත.
4. මෝදර ප්‍රධාන කාර්යාලයේ ඇති මෙට්‍රික් ටොන් 200 ශීතාගාරය කඩිනමින් අලුත්වැඩියා කර ක්‍රියාත්මක කිරීමට යෝජිතය .මත්ස්‍ය නිෂ්පාදන ඉහළ කාලසීමාවන් තුළ මත්ස්‍යයන් මිල දී ගෙන අඩුම මිලට ගබඩා කර මාළු හිඟ කාලවලදී වැඩි ලාභයකට අලෙවි කිරීමට යෝජනා කෙරේ.
5. දිවයින පුරා ක්‍රියාත්මක වන සියලුම රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලයට සහන මිලට මාසික වැටුපෙන් අයකර ගැනීමේ පදනම මත මාළු ලබාදීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.
6. කොළඹ දිස්ත්‍රික්කයේ ධීවර සංස්ථා සුපිරි වෙළඳ සංකීර්ණයක් විවෘත කිරීමට යෝජිතය.
7. මුලතිව් දිස්ත්‍රික්කයේ අභාවයට ගිය කෝකිලායි මත්ස්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර විවෘත කර ඇත. මුලතිව් ධීවරයින්ට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම සඳහා සිංහපුර, පුල්මුඩේ කෝකිලායි පිරවුම්හල පරිශ්‍රයේ ස්ථාපිත කර නැවත ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.
8. දැනට සංචාරක නිකේතන ලෙස ක්‍රියාත්මක වන නුවරඑළිය, කලමැටිය, මින්නේරිය සහ සිංහපුර නිවාඩු නිකේතනවල ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ධීවර සංස්ථා සංචාරක හෝටල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශයන්ට අනුව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.
9. මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රය තුළ නවීනතම වාහන සේවා මධ්‍යස්ථාන ඇතුළු ධීවර සංස්ථා ඉන්ධන පිරවුම්හල් පිහිටුවීමට යෝජිතය.

## 8.6 සීමාසහිත සීනෝර් පදනම

**දැක්ම**

යාත්‍රා නිෂ්පාදනයේ හා  ධීවර සේවාවන් සැපයීමේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

තිරසර පරිසරයක් තුළ නවෝත්පාදනයන් තුළින් පාරිභෝගික තෘප්තිය සමඟ සේවා විශිෂ්ටතාවය පවත්වා ගැනීම.

**අරමුණු**

- ෆයිබර් ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරුවෙකු බවට පත් වීම.
- ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත් වීම.
- විදේශ රටවල් තුළ ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතකයෙකු බවට පත් වීම.
- ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ෆයිබර් නිෂ්පාදන සැපයීම.
- විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නකු වීම.

**කාර්යයන්**

- සී/ස සීනෝර් පදනම විසින් දේශීය කරදිය සහ මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය කරන ෆයිබර් ග්ලාස් ධීවර යාත්‍රා, බෝට්ටු. ඔරු, කොල්ලෑ සහ අනෙකුත් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත ධීවර ආම්පන්න නිෂ්පාදනය කර සපයනු ලබයි.
- සංචාරක කර්මාන්තය සඳහා නවීන යාත්‍රා නිෂ්පාදනය සමඟ සමුද්‍රීය සේවා සැපයීම
- විවිධ ෆයිබර් ග්ලාස් නිෂ්පාදන නිපදවීම සඳහා යොමුවීම.

**2023 වසරේ ක්‍රියාත්මක කරනු ලැබු සංවර්ධන ව්‍යාපෘති**

- මහවැලි අධිකාරිය වෙත පොලිටනල් නිෂ්පාදනය කිරීම.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ලොතරැයි කුටි ඉදිකිරීම
- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (FAO) Bulbous bow නිෂ්පාදනය
- ධීවර දෙපාර්තමේන්තුව සඳහා Fish Aggregating Devices (FAD) නිෂ්පාදනය.

**යෝජිත නව ව්‍යාපෘති**

- ධීවර හා සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය වන නව යාත්‍රා හා අනෙකුත් ෆයිබර් අයිතම නිෂ්පාදනය කිරීම.
- ඉන්දියානු ආධාර යටතේ කරෛනගර් යාත්‍රාංගනයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම

## 8.7 පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය, ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එය පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය මගින් පාලනය වේ. මෙම භාරකාර මණ්ඩලය 2010 මැයි 14 වන දින ඉදිරිපත් කර ඇති අංක 10/0958/438/001 දරණ සහ "පැලියගොඩ අති නවීන මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය සඳහා කළමනාකරණ භාරය පිහිටුවීම" යන මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශය සහ ඊට අදාළ 2010.06.03 දිනැති අංක අමප/10/0958/438/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පිහිටුවා ඇත. කළමනාකරණ භාර මණ්ඩලය සාමාජිකයින් පහත සඳහන් පරිදි වන අතර එහි සභාපති ධූරය ධීවර අමාත්‍යාංශ ලේකම් විසින් දරනු ලැබේ. මේ වනවිට සංස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පත සකස් කරමින් පවතී.

1. මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්
2. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්

3. වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්
4. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්
5. මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙක්
6. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්
7. ශ්‍රී ලංකා ධීවර සංස්ථා සභාපති
8. කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ප්‍රාදේශීය ලේකම්තුමා
9. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්
10. පැලියගොඩ නගර සභාවේ සභාපති
11. ධීවර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්
12. පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ වෙළඳ සංගමයේ සභාපති
13. ශ්‍රී ලංකා ජාතික ධීවර සමූපකාර සංගමයේ සභාපති
14. කොළඹ පාරිභෝගිකයන්ගේ සංගමෙයේ සභාපති

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයෙහි පරමාර්ථ වන්නේ

01. පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය පාලනය හා කළමනාකරණය.
02. පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයෙහි ඵලදායී මෙහෙයුම් ක්‍රියාකාරීත්වය, කළමනාකරණය හා අඛණ්ඩත්වය පවත්වාගෙන යාම සහ ඵලදායී කළමනාකරණය උදෙසා පවත්නා ප්‍රශ්න වලට අදාලව තීරණ ගැනීම.
03. ඉහත පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සීමා විරහිතව අදාල කටයුතු හා ක්‍රියාමාර්ග ගැනීම.

<u>**මූල්‍ය තත්වය - 2023 වර්ෂය**</u>

| | |
|---|---|
| මුළු ආදායම | 180,424,100.96 |
| මෙහෙයුම් වියදම (ක්ෂය ගැළපීමට පෙර) | 123,763,681.67 |
| අතිරික්තය (ක්ෂය ගැළපීමට පෙර) | 56,660,419.29 |
| වර්ෂයට අදාළ ක්ෂය | 64,166,743.79 |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | (7,506,324.50) |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FLS/B/MF/2/23/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 2 දින


ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
ධීවර අමාත්‍යාංශය

ධීවර අමාත්‍යාංශයේ **2023** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **11(1)** වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත්




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ යොමුව | ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.6 | විගණනයට අවශ්‍ය විස්තර ඉදිරිපත් නොකිරීම | 1.6.4 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

(අ) විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.743,452 ක්වූ අතර එම හිඟ හිටි ණය ශේෂවලින් රු.629,842 ක් හෙවත් සියයට 84 ක් වර්ෂ 20 ට වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂ විය.

(ආ) 2023 අගෝස්තු 01 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන තිබූ වැටුප් අංක 516 දරන කළමනාකරණ සේවා නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.75,644 ක ණය ශේෂය අමාත්‍යාංශයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයක් ලෙස රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට සාමාජික ණය ලේඛනය අනුව වැටුප් අංක 783 දරන සංවර්ධන නිලධාරිනියකගෙන් අයවිය යුතු උත්සව අත්තිකාරම් රු.10,000 ක් හා ආපදා ණය රු.234,255 ක් වශයෙන් එකතුව රු.244,255 ක්වූ නමුත් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ආපදා ණය ශේෂය ලෙස රු.244,255 ක් වශයෙන් දක්වා තිබීම

හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට උත්සව අත්තිකාරම් මුළු ණය ශේෂ එකතුව රු.10,000 ක් අඩුවෙන් හා ආපදා ණය ශේෂ එකතුව එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**1.6.2 මූල්‍ය නොවන වත්කම්**

(අ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් (SA 82) ප්‍රකාශයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.721,915,845ක් විය.එහෙත් 2023 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 2023 ජනවාරි 01 දින ශේෂය රු.701,459,049ක් ලෙස දැක්වීම නිසා රු.20,456,796ක වෙනසක් විය.

(ආ) 2023 වර්ෂයේ වැය විෂයය අංක 151-1-2-0-2104 යටතේ රු.27,525,864 ක ගොඩනැගිලි සහ ඉදිකිරීම් මූලධන වත්කම් අත්කර ගැනීමක් සිදුකර තිබුණ ද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) 2023 වර්ෂය තුළ මිලදී ගැනීම් රු.45,207,775 ක් ලෙස දක්වා තිබීම නිසා රු.17,681,911 ක වෙනසක් විය.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය සතු රු.994,254,549 ක වටිනාකමකින් යුතු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ලබා දී නොතිබූ අතර සියලුම ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා ද විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වත්කම් පරීක්ෂා කිරීමට හෝ මෙම වත්කම් භෞතිකව ආයතනය සතුව පවතී ද යන්න පරීක්ෂා කිරීමට හෝ නොහැකි විය. එබැවින් රු.994,254,549 ක මූල්‍ය නොවන වත්කම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැක.

**1.6.3 තැන්පතු ගිණුම් ශේෂ**

(අ) (i) 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව එක් එක් මාසයේ දායක මුදල්, ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබීමට සැලැස්වීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වුවද, 2022 නොවැම්බර් මස සිට 2023 අප්‍රේල් මස දක්වා වූ ධීවර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් අය කරගෙන තිබූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය වූ රු.545,256 ක මුදලක් අංක 6000-0-0-18-0-151 දරන ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් තැන්පතු ගිණුමේ ද, 2023 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා වූ ධීවර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් අය කරගෙන තිබූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය වූ රු.816,123 ක මුදලක් අංක 6000-0-018-045 දරන ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

(ii) ධීවර අමාත්‍ය කාර්යාලයේ හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ 2022 ඔක්තෝබර් මස වැටුපෙන් අයකළ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය වූ රු.28,569 ක් හා රු.90,876 ක් වශයෙන් එකතු වටිනාකම රු.119,445 ක් වූ චෙක්පත් 2 ක් එම කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් අරමුදලේ ලියාපදිංචි කර නොමැතිවීම හේතුවෙන් එම චෙක්පත් අවලංගු වී තිබුණු අතර එම චෙක්පත් අංක 6000-0-0-13-0-40 දරන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම

වෙනුවෙන් තාවකාලික රඳවා ගන්නා තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විගණනය වෙත ඉදිරිපත් කර තිබූ 2023 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 01, ආකෘති පත්‍රය 03 මගින් ඉදිරිපත් කර තිබෙන 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණ වාර්තාවේ අංක 6000-0-0-016-0-140-0 දරන කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ අවුරුදු 5 ට වැඩි රු.31,910,669 ක තැන්පතු ශේෂයන් අවුරුදු 2-5 ත් අතර කාණ්ඩයට ඇතුළත් කර සැසඳුම් ප්‍රකාශය සකස් කර තිබීම හේතුවෙන් අවුරුදු 2-5 ත් අතර තැන්පතු ශේෂ කාණ්ඩය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වීමත් අවුරුදු 5 ට වැඩි තැන්පතු ශේෂ කාණ්ඩය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දැක්වීමත් නිසා පොදු තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණය නිවැරදි නොවිය.

(ඇ) මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, වර්ෂ 2-5 ත් අතර වූ එකතුව රු.167,195,801 ක තැන්පතු ශේෂ ද, වර්ෂ 5 ඉක්මවූ රු.31,910,669 ක්වූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) දළ රළ සවිය 2023 ලෝක ධීවර දිනය වෙනුවෙන් විවිධ පෞද්ගලික ආයතන විසින් ධීවර අමාත්‍යාංශය වෙත රු.2,920,000 ක මූල්‍යාධාර ලබා දී තිබුණු අතර එයින් රු.2,313,791 ක් සමාලෝචිත වර්ෂය තුල වියදම් කර ඉතිරි රු.606,209 ක මුදල අංක 6000-0-0-13-0-40 දරන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලික රඳවා ගන්නා තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණ අතර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා පිළිවෙලින් රු.696,000,000 ක් වූ ප්‍රතිපාදන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සඳහාද, රු.601,000,000 ක් වූ ප්‍රතිපාදන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සඳහාද හා රු.731,000,000 ක් වූ ප්‍රතිපාදන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) වෙත වෙන්කර දී තිබුණි. එමෙන්ම පරිපූරක ප්‍රතිපාදන මගින් ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.100,000,000 ක අමතර ප්‍රතිපාදනයන් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සඳහා වෙන්කර දී තිබුණි. ධීවර අමාත්‍යාංශය යටතේ නියාමනය වන මෙම රාජ්‍ය ආයතන 03 සඳහා ධීවර අමාත්‍යාංශය විසින් රු.1,813,944,000 ක අක්මුදල් 2023 වර්ෂය තුල දී ලබා දී තිබුණද, එක් එක් වැය විෂයය තුළ ඇති උප ව්‍යාපෘති සඳහා ලබා දුන් අක්මුදල් ප්‍රමාණය, ඉල්ලුම් කළ අක්මුදල් ප්‍රමාණය, ඒවා වියදම් කල ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් වියදම් වාර්තා, තොරතුරු හා එම එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කල තොරතුරු හෝ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.1,813,944,000 ක වියදම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. ධීවර අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තින් මත පිහිටා ධීවර විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති

දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරිම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරිම හා ඇගයීම සඳහන් කර තිබුණ ද, අමාත්‍යාංශය විසින් මෙම ආයතන පසුවිපරම් කිරිම හා ඇගයීම සිදුකර නොතිබුණි. වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආයතනය | සත්‍ය වියදම (2023) | | |
|---|---|---|---|
| | පුනරාවර්තන | මූලධන | එකතුව |
| | රු. | රු. | රු. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) | 529,066,000 | 108,950,000 | 638,016,000 |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | 427,615,000 | 58,778,000 | 486,393,000 |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) | 643,545,000 | 45,990,000 | 689,535,000 |
| | | | **1,813,944,000** |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපකරණ පිළිබඳ ලේඛන පොතක් පවත්වා නොතිබුණි. |
| පොත් නාමාවලිය | මුදල් රෙගුලාසි 454(3) | මුදල් රෙගුලාසි 454(3) ප්‍රකාරව නව නීති වාර්තා,ව්‍යවස්ථාදායක පනත්, ආණ්ඩුවේ රෙගුලාසි, අමාත්‍යාංශ වාර්තා, වාර්ෂික ප්‍රකාශන හා අනෙකුත් වටිනා ප්‍රකාශන ආදී පොත් සඳහා ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිලියෙල කලයුතු වුවත් පහත දැක්වෙන නිරීක්ෂණ අනුව එම මුදල් රෙගුලාසිය අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) 2023 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවූ, මූලධන වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.140,000,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණ ද රු.76,564,779 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. ඒ අනුව අංක 151-2-4-1-2202-0-11 දරන මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වන වැය විෂයය සහ 2023 වර්ෂයේ බැදීම් නිරවුල් කිරීම සඳහා අංක 23/1758/606/018 හා 2023 ඔක්තෝබර් 02 දිනැති කැබිනට් තීරණයට අනුව අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, ඉන් උපයෝජනයට ගෙන තිබුණේ සියයට 44 ක් පමණි. වැය විෂයය අංක 151-1-2-0-2202-0-17 යටතේ මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රදානයක් වශයෙන් ධීවර යාත්‍රා සඳහා ලබා දී තිබූ භූමිතෙල් සහනාධාරය වෙනුවෙන් එම ඉන්ධන ධීවර යාත්‍රා වෙත බෙදා හැරීම සඳහා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ප්‍රවාහන හා බෙදුම්කරු ගාස්තු වෙනුවෙන් සලසාගෙන තිබූ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් උපයෝජනයට ගෙන තිබුණේ සියයට 49 ක ප්‍රමාණයකි. ඒ අනුව පරිපූරක ඇස්තමේන්තු මඟින් මූලික අයවැය ඇස්තමේන්තුව වැඩි කරගැනීමට කටයුතු කර තිබුණ ද එම ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය කරගෙන නොතිබුණි.

(ආ) වැය විෂයය අංක 151-2-4-2-1509-0-11 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සඳහා වෙනත් මෙහෙයුම් වියදම් යටතේ වාර්ෂික අයවැය මඟින් රු.100,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර රු.28,000,000 ක් මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් අතිරේක ප්‍රතිපාදන වශයෙන් සලසා ගෙන තිබුණ ද 2023 දෙසැම්බර් 31 දිනවන විට මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරගත් රු.28,000,000 ක්ද ඇතුලුව රු.31,517,000 ක මුදලක් උපයෝජනයට ගෙන නොතිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 66 මඟින් සියයට 28 කින් මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනය වැඩි කරගෙන තිබුණ ද එම ප්‍රමාණයම උපයෝජනයට ගෙන නොතිබුණි.

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) ධීවර අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.2,005,845 ක් වුවද, SA 92 භාණ්ඩාගාර සමුච්චිත බැදීම් බැරකම් වාර්තාව අනුව එදිනට බැරකම් ශේෂය රු.2,605,845 ක් වුයෙන් රු.600,000 ක වෙනසක් විය.

(ආ) ධීවර අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 28 දින සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස රු.185,910,000 ක වටිනාකමින් යුත් බිල්පත් අතැතිව ඇති බව දක්වා තිබුණද එම බිල්පත් වටිනාකම අමාත්‍යාංශයේ බැදීම් හා බැරකම් යටතේ හදුනාගෙන නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| මුදල් රෙගුලාසි 104(1) | නාරාහේන්පිට, මුහන්දිරම් ඊ.බී.දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබූ ධීවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා ධීවර අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ලබා දී තිබූ සියලුම රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් විගණනය වෙත වාර්තා කර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව මෙම නිල නිවස තුල තිබුණු රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සියල්ලම අස්ථානගත වී තිබීම සහ රජයේ ගොඩනැගිලිවලට හානි සිදු වී තිබීම නිසා රජයට සිදුවී තිබෙන රු.1,808,262ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ධීවර අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13.6 උපවගන්තිය | මාස දොළහක කාලපරිච්ඡේදයක් තුළ දී උත්සව අත්තිකාරම් මුදල දිය යුත්තේ එක් වරක් පමණක් වුවද අමාත්‍යාංශය විසින් නිලධාරීන් 4 දෙනෙක් වෙත 2023 වර්ෂය තුළ දී දෙවතාවක් රු.10,000 බැගින් උත්සව අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. |
| අංක 05/2008 දරන 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | ධීවර අමාත්‍යාංශය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය 2023 වර්ෂය සඳහා සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොතිබුණි. |
| අංක 02/2018 දරන 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ධීවර අමාත්‍යාංශය විසින් මානව සම්පත් සැලැස්මක් 2023 වර්ෂය වෙනුවෙන් සකස් කොට නොතිබුණි. |

| | |
|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර, එකී ගෙවීම් පිළිබඳ විස්තර, විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා යැවීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එලෙස කටයුතු කර නොතිබුණි. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

අංක 7042730 දරන නිල බැංකු ගිණුම 2023 ජූලි මස දක්වා ක්‍රියාත්මකව තිබුණු අතර දෙසැම්බර් අවසාන වන විට එහි ශේෂයන් නොමැති වුවද එය වසා දැමීමට කටයුතු කර නොමැති බව ලිපිගොනු පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර 2023 මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) සහ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවේ මෙම බැංකු ගිණුම පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 සැලැසුම් කිරීම

(අ) 2023 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් 3ක් සඳහා රු.6,360,000 ක ප්‍රතිපාදන වෙන්කර සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂාකළද, ඊට අදාළ භෞතික කාර්යසාධනය සියයට 75 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) ධීවර අමාත්‍යාංශයේ 151 වැය ශීර්ෂය යටතේ සංවර්ධන වැය විෂයයන් 4ක් වෙනුවෙන් ලබා දී තිබුණු රු. 196,685,000 ක ප්‍රතිපාදන වැයකළ ආකාරය දැක්වෙන විස්තරාත්මක ප්‍රගතිය, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගති වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

### 3.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) ධීවර වරායයන් සහ නැංගුරම්පල ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වූ 2013 ජූලි 04 දිනැති අංක 1/5/1/1/අමා.සං/2013-09 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී තිබූ අනුමැතියට අනුව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කයිකාවල මුහුදු ප්‍රදේශයේ නැංගුරම්පලක් ඉදිකිරීම වෙනුවෙන් පැකේජ 01 සහ 02 වශයෙන් ලංසු කැඳවීම් සිදුකර පැකේජ 01 රු.132,602,410 ක කොන්ත්‍රාත් වටිනාකමට සහ පැකේජ 02 රු.113,198,400 ක කොන්ත්‍රාත් වටිනාකමට වසරක් ඇතුළත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිම කිරීම මත පැකේජ 02 සඳහාම 2014 සැප්තැම්බර් 14 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් සමාගම විසින් පැකේජ 02 සඳහාම ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 29 දින රු.49,160,162 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් පැකේජ 02 සඳහාම ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමත් සමගම නවතා දැමීමට සිදුවී තිබුණු අතර අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පවත්වාගෙන ගිය කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනය අනුව මූලික පාරිසරික වාර්තාව (IEE) ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.443,975 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතියේ උපදේශක සමාගමට ගෙවා තිබූ බව සඳහන් වුවද, රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර තිබුණු නීති අංශය තුළ පවත්වාගෙන ගිය මෙම ව්‍යාපෘතියට අදාළ ලිපිගොනු තුළ මූලික පාරිසරික වාර්තාව නොවීය.

### 3.1.3 මුදල් ගෙවීම් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) ධීවර අමාත්‍යාංශය විසින් කළමැටිය ධීවර වරායේ සීසීටීවී ආරක්ෂිත පද්ධතිය සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 14 දින රු.5,849,100 ක බදු රහිත වටිනාකමකට කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණු අතර කළමැටිය ධීවර වරායේ සවි කර තිබූ කැමරා කිහිපයක් නිසි අයුරින් ක්‍රියානොකිරීම හා ඒවා සැපයුම් කළ ආයතනය විසින් නිසි පරිදි නඩත්තු නොකරන තත්ත්වයක් යටතේ 2022 දෙසැම්බර් 30 වන දින රු.435,037.72 ක්ද 2023 අප්‍රේල් 19 දින රු.292,455 ක්ද වශයෙන් චෙක්පත් 2 ක් සහතික හා අනුමත කර වැය ලෙජර්වලට ගිණුම්ගත කර මාස 08 කට වැඩි කාලයක් අමාත්‍යාංශය විසින් රඳවා තබාගෙන චෙක්පත්වල වලංගු කාලය ඉක්මවූ විට තෙවන පාර්ශවයන් වෙනුවෙන් නැවත ගෙවීම් සඳහා වූ තැන්පතු ගිණුමට මාරුකර තිබුණ අතර 2023 දෙසැම්බර් 31 දිනවන විටත් අමාත්‍යාංශ තැන්පතු ගිණුමේ එම චෙක්පත් රඳවාගෙන තිබුණි.

(ආ) 2023 සැප්තැම්බර් 01 දින අලුත්වැඩියා කටයුතු සිදුකිරීමෙන් පසු දින සිටම කළමැටිය ධීවර වරායේ සවිකර ඇති කැමරා 39 අක්‍රීය තත්ත්වයේ පවතින බව 2023 සැප්තැම්බර් 04 දින කළමැටිය ධීවර වරායේ කළමනාකරු විසින් කළමනාරකණ තොරතුරු තාක්ෂණ නිලධාරි දැනුවත් කර තිබුණි. කොන්ත්‍රාත් ආයතනය විසින් සවි කරන ලද කැමරා සඳහා වසර 2 ක වගකීම් කාලසීමාවක් පවතින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කර කැමරා පද්ධතිය යථා තත්ත්වයට පත්කරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) රැකව නැංගුරුම්පළ සංවර්ධන ව්‍යාපෘතිය රු.311,482,215 ක (වැට් රහිත) මුදලකට දින 365 කින් වැඩ නිම කිරීමේ පදනම මත කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබූ අතර 2020 ඔක්තෝබර් 20 දින වැඩ ආරම්භ කර තිබුණි. 2021 වර්ෂයේ ඔක්තෝබර් 19 දින වැඩ අවසන් කිරීමට අමාත්‍යාංශය සමග ගිවිසුම් ගත වී තිබුණි. නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා අවස්ථා 4 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගැනීම් සිදුකරගෙන තිබුණි. ඒ අනුව දින 365 කින් අවසන් කළයුතු ව්‍යාපෘතිය තවත් දින 384 කින් දීර්ඝ කර ගැනීමෙන් පසුව 2022 වර්ෂයේ නොවැම්බර් 08 දින වැඩ අවසන් කර ධීවර අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් රු.3,398,637 ක මුදලක් ප්‍රමාද පොළි සහ රු.464,637ක් ප්‍රමාද පොළි මත එකතුකළ අගය බදු වශයෙන් එකතුව රු.3,863,274 ක වටිනාකමක් කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීම් කර තිබුණි.

(ආ) ධීවර අමාත්‍යාංශය විසින් ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක ව්‍යාපෘති නිම කිරීමේ කාලය දීර්ඝ කර තිබූ අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා මුදල් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් විශාල වශයෙන් ප්‍රමාද පොලී ගෙවීම් කර තිබුණි. එවැනි අතිරේක ප්‍රමාද පොලී වියදම් සඳහා ද රජයේ ප්‍රතිපාදන මුදල් යෙදවීමට සිදුව තිබීම තුළින් රජයට විශාල මූල්‍යමය අලාභයක් සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 31 දින වනවිට ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘති 05 සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු.209,693,847 ක මුදලක් ප්‍රමාද පොලී ලෙස ගෙවා තිබූ අතර රු.20,493,676 ක ප්‍රමාද පොලී මුදලක් තවදුරටත් ගෙවීමට සහතික කර තිබුණි.ඒ අනුව ගෙවා තිබූ ප්‍රමාද පොලී එකතු වටිනාකම රු.230,187,523 ක් විය.

(ඇ) වෙල්ලමංකර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා අමාත්‍යාංශය විසින් මුදල් නොගෙවීම හේතුවෙන් වූ ප්‍රමාද පොලී ගාස්තු රු.36,351,185 ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් විනිශ්චය මණ්ඩලය වෙත අභියාචනා කර ඇති අතර ඒ වෙනුවෙන් රු. 960,000 ක මුදලක් අමාත්‍යාංශය විසින් නීති වියදම් සඳහා දරා තිබුණි. ඉන් පසු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය වෙත අභියාචනා කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 354,500 ක මුදලක් නීති වියදම් සඳහා ගෙවීම් කර තිබුණි. නියමිත වේලාවට බිල්පත් සඳහා ගෙවීම් සිදුනොකිරීම නිසා අතිරේකව දැරීමට සිදුවන පොලී වියදමට අමතරව නීති කටයුතු වෙනුවෙන් රු.1,314,500 ක මුදලක් අමාත්‍යාංශය විසින් දරා තිබුණු අතර මෙම ගැටලුව 2023 දෙසැම්බර් 31 වනවිටත් අවසන් වී නොතිබුණු බැවින් බිල්පත් ප්‍රමාද වී ගෙවීම් සිදුකිරීම තුළින් රජයට විශාල පාඩුවක්/අලාභයක් සිදුව තිබුණි.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු විගණන විමසුම් 4 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

### 3.4 කළමනාකරණ දුර්වලතා

ධීවර අමාත්‍යාංශ කාර්යාල ගොඩනැගිල්ලේ අතිරේක මහල් 3 ක් ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 23 දිනැති අමප/16/2333/725/044 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.242,511,455.[illegible] ක වටිනාකමට 2018 ජුනි 12 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව 2018 ජුනි 26 දින කොන්ත්‍රාත් සමාගම වැඩ ආරම්භ කර තිබුණු අතර එය දින 365 කින් එනම් 2019 ජුනි 25 දින වැඩ අවසන් කිරීමට තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු අපේක්ෂිත කාර්යක්ෂමතාවයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 06 දින අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. මෙම කොන්ත්‍රාත්කරු අසාදුගත කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. මෙම අතිරේක මහල් තුන ඉදිකිරීම් කාර්යය සිදුකිරීමේ දී කොන්ත්‍රාත්කරු නොසැලකිලිමත්ව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම නිසා අමාත්‍යාංශයේ මහල් තුළට වැසි ජලය කාන්දු වී රු.10,061,054ක රජයේ දේපලවලට හානි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම හානිය සිදු වී වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, සිදු වී තිබුණු රජයේ දේපළ හානිය අයකර ගැනීමට හා මෙවැනි හානි වලක්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ධීවර අමාත්‍යාංශය යටතේ 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලවල තොරතුරු පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විධායක මට්ටම | 29 | 21 | 09 | 01 |
| තෘතියික මට්ටම | 04 | 04 | - | - |
| ද්විතියික මට්ටම | 169 | 137 | 32 | - |
| ප්‍රාථමික මට්ටම | 40 | 39 | 02 | 01 |
| වෙනත් | 05 | 06 | 03 | - |

1. ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු 09 කට අදාළ පුරප්පාඩු 09 ක් සහ ද්විතීක මට්ටමේ තනතුරු 02 කට අදාළ පුරප්පාඩු 32 ක් පැවතීම ධීවර අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟාවීමට බාධාවක් විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

2. විගණනයට ඉදිරිපත් කර තිබූ අනුමත කාර්ය මණ්ඩල සහ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තරය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබානොගත් කළමනාකරණ සහකාර, රියදුරු හා කාර්යාල කාර්ය සහායක තනතුරුවල නිලධාරීන් 4 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දිනවන විට සේවයේ යෙදී සිටින බව නිරීක්ෂණය විය.

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට